**වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 24 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා |
| 02. ගරු උප සභාපති | - | එච්.ඒ නන්දසෝම මහතා |
| 03.ගරු මන්ත්‍රී | - | වී.මුරලිදරන් මහතා |
| 04. ගරු මන්ත්‍රී | - | එච්.ජී මහින්ද ගුණසේකර මහතා |
| 05.ගරු මන්ත්‍රී | - | ශාන්තලාල් පෙරේරා මහතා |
| 06.ගරු මන්ත්‍රී | - | ජී.එස්.ඒ ෆොන්සේකා මහතා |
| 07. ගරු මන්ත්‍රී | - | කේ.ඕ සෝමතිලක මහතා |
| 08. ගරු මන්ත්‍රී | - | එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා |
| 09. ගරු මන්ත්‍රී | - | එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා |
| 10. ගරු මන්ත්‍රී | - | ජී.කේ.පී ෆොන්සේකා මිය |
| 11. ගරු මන්ත්‍රී | - | ටී.ඒ.ඩී.සී දමයන්ති මිය |
| 12. ගරු මන්ත්‍රී | - | එච්.ජී මෛත්‍රීපාල මහතා |
| 13. ගරු මන්ත්‍රී | - | එච්.ඒ.එන්.සී රණසිංහ මහතා |
| 14. ගරු මන්ත්‍රී | - | අයි.රාමකිලි මහතා |
| 15. ගරු මන්ත්‍රී | - | ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා |
| 16. ගරු මන්ත්‍රී | - | පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි |
| 17. ගරු මන්ත්‍රී | - | එස්.එල්.අරුණ ශාන්ත මහතා |
| 18. ගරු මන්ත්‍රී | - | එන්.එම් සුසිලා දමයන්ති මිය |
| 19. ගරු මන්ත්‍රී | - | කේ.ඕ කුසුම්ලතා මිය |

නොපැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු මන්ත්‍රී | - | එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය |

**01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරිම**

ගරු මන්ත්‍රීඑච්.ජී මෛත්‍රීපාල මහතා

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ගරු මහින්ද මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තියනවා යෝජනාවක් සුසාන භූමියක් මැනුම් කිරීම කියලා. ඒක එක පුද්ගලයෙකුට නෙවෙයි එතන තියනවා මරණාධාර සමිති 5 ක්. ඒ 5 ම දැනුවත් කරන්න ඕනි කොතනද තැන කියන එක. සමහරවිට දැන් ඔය සමරනායක කියන පුද්ගලයා ලියුමක් දෙන්න ඇත්තේ එයාගේ ඉඩමට කිට්ටු තැනකද දන් නෑනේ. එයාගේ හිතවත් කෙනෙක්ගේ පළිගැනීමක්ද දන්නේ නෑනේ. ඒ නිසා මරණාධාර සමිති 5 ක් තියනවා. ඒ 5 න්ම ලියුම් අරගෙන අපිට පුළුවන් ස්ථානයක් වෙන් කර ගන්න.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා

ගරු මන්ත්‍රීඑච්.ජී මෛත්‍රීපාල මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය සහිතව 2022 ඔක්තෝබර් මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව 2022 ඔක්තෝබර් මස මහා සභා වාර්තාවපෙන්වා දෙන ලද සංශෝධනය සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

02 - 01 ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙරළුගොල්ල හන්දිය, දෙකිඳ පාර, නාවලපිටිය ලිපිනයේ පදිංචි එම්. ඒ. සම්පත් කුමාර ජයසිංහ මහතා 2021 වර්ෂයේ තායිලන්තයේ පවත්වන ලද මුයිතායි ලෝක ශූරතාවලියට සහභාගි වීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 10,000.00 ක මුදලක් ලබා දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 02 ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයිඩ්‍රි ග්‍රාම සේවා වසමේ ග්ලිස්ටන් ගම රොසැල්ල පිහිටි ශ්‍රී ඥාන ගනේෂර කෝවිලට අඩි 1 ½ ක් උසැති මුහුණු පහක් සහිත පිත්තල ශ්‍රී ඥාන ගනේෂර දේව රූපයක් ලබා දීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 35,000.00 ක මුදලක් ලබා දිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 03 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම, ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමියන්ගේ ප්‍රතිපාදන මුදලින් රොසැල්ල හයිඩ්‍රිවත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානයට සාස්පාන් කට්ටලයක් මිලදී ගැනීම සඳහා රු. 40,000.00 ක මුදලක් ලබා දීම (ඇස්තමේන්තුව රු. 38,000.00) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය, වැලිගම්පොල, කැන්දපිටිය, අංක 169 හි පදිංචි ඩී. එම්. නිදුකා ප්‍රියදර්ශනී මහත්මියගේ දියණිය වන ඩබ්. ජී. චාමලී රශ්මිකා දියණිය සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 25,910.00 ක මුදලක් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 05 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
වරිපනම් බදු සහ අනෙකුත් අයකිරීම් - වරිපනම් ප්‍රතිශෝධන සම්බනධවයන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 ලේකම්, මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ පැවැත්වූ සාකච්ඡාව සම්බන්ධවයි - වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
2022. 08. 25 දින පවත්වන ලද මහා සභා රැස්වීම් වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම, හයිඩ්‍රිවත්ත ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයට සිමෙන්ති ලබා දීම වෙනුවෙන් 2022 වර්ෂයේ සභා අරමුදලින් රු. 50,000.00 ක මුදලක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, රු. 48,000.00 ක මුදලක් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 09 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම, හයින්ෆෝඩ් බී ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයේ විහාරාධිකාරී කටු කිතුලේ සෝමරතන ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 20,500.00 ක මුදලක් සඳහා අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 10 සුනිල් විමලසූරිය, නො. 5/4, හල්දොරවත්ත, බලන්තොට, රඹුක්පිටිය
වැසි ආවරණයක් ලබා දීම සම්බන්ධව ස්තූතිය පුද කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 11 ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
හයිඩ්‍රිවත්ත ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයට සිමෙන්ති ලබා දීම වෙනුවෙන් 2022 වර්ෂයේ සභා අරමුදලින් රු. 50,000.00 ක මුදලක් ලබා දිම සඳහා සභා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව රු. 48,000.00 ක මුදලක් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 –12ප්‍රධාන ඉංජිනේරු, මාර්ග හා කර්මාන්ත කාර්යාලය, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10
ඉගුරුඔය දුම්රිය හරස් මාර්ගයක් ඉදිකිරීම සම්බන්ධයෙනි (දිස්ත්‍රික් ඉංජිනේරු වෙත යවන ලද ලිපියේ පිටපත) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 13කලාප සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය
ඉගුරුඔය - හඟරන්ඔය දිය ඇල්ල ආශ්‍රිත ඉඩම් කොටස ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන ලෙස ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්,පැමිණිලි හා ලිපි සභාගත කිරිම**
නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**
නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**
05 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

අප ප්‍රාදේශිය සභාව සතු පැරණි ගොඩනැගිලි (ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, නිල නිවස සහ සායන ගොඩනැගිල්ල) කඩා ඉවත්කරගෙන යැම සඳහා ටෙන්ඩර් කැඳවීමට අවම ලංසු මුදල රුපියල් 640,000.00 ලෙස රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර වාර්තා කර ඇත. ඒ අනුව පුවත්පත් දැන්වීමක් පළ කොට ලංසු කැඳවීමෙන් අනතුරුව වැඩිම මුදලට එම ලංසුව ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු. 100,000.00 ක මුදලක් දඹුබැදිරුප්ප කොට්ඨාශයට වීථි පහන් ලබා දීම සඳහා යෝජනා ස්ථිර වී තිබුණු අතර එම යෝජනාව වෙනස් කර පහත සඳහන් යෝජනා වෙනුවෙන් උක්ත මුදල වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි

1. උඩකටුකිතුල අමරසේන මහතාගේ නිවස අසලින් යන බෝක්කුව සහ දන්ගහදෙනිය බෝක්කුව යන බෝක්කු දෙක සංවර්ධනය කිරීම සඳහා කටුකිතුල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ප්‍රතිපාදන ලබා දීම
2. දඹුබැදිරුප්ප පහළ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ඉහුරුඔය ගම්මානයට ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් සමනලගම නව ගම්මානය හරහා දුම්රිය හරස් මාර්ගය ඔස්සේ ඉහුරුඔය දකුණ දක්වා දිවෙන පැරණි මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත අතර එහි ඉහුරුඔය දුම්රිය ස්ථානය අසල සිට ඉහුරුඔය දකුණ දක්වා දිවෙන මාර්ගයේ විදුජය පෙර පාසල අසල මාර්ගයේ බෝක්කුවක් අවහිර වීම හේතුවෙන් ප්‍රධාන මාර්ගයද අබලන් වී ඇත. එබැවින් එම ස්ථානය සුදුසු පරිදි සැකසීම සඳහා ඉහුරුඔය උතුරු සුහද ප්‍රජා මණ්ඩලය වෙනුවෙන් වෙන් වූ ප්‍රතිපාදන යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් ඉහුරුඔය දුම්රිය ස්ථාන අංගනයේ දුම්රිය හරස් මාර්ගයට අන්තර්බද්ධ නොවන තාවකාලික ගේට්ටුවක් (බම්බු ගේට්ටුවක්) ස්ථාපිත කිරීම යන මැයෙන් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඒ සම්බන්ධයෙන් අමුද්‍රව්‍ය, කම්කරු හා අධීක්ෂණ ගාස්තු ඇතුළත් දෙපාර්තමේන්තු ගාස්තුවේ 15% වැට් බදු මුදලත් සමඟ වියදම වන රු. 225,872.50 ක මුදල දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 05 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශයන් මත පහත සඳහන් කටයුතු සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

- වරකාව සුහද ප්‍රජා මණ්ඩලය - ගලේගෙදර මාර්ගයේ ළිඳ සංවර්ධනය කිරීම
- මීපිටිය ප්‍රජා මණ්ඩලය - මීපිටිය උපාලි මාවත (අශෝකාරාම විහාරස්ථ මාර්ගය) ප්‍රතිසංස්කරණය කිරීම

<u>ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 06 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ආදායම් උත්පාදක මාර්ගයක් ලෙස සකස් කරන ලද මාධ්‍ය සහිත වගා මළු සහන මිලට අලෙවි කිරීමේ ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා වගා මළු සකස් කර ගැනීම සඳහා පොලිතින් සීලරයක් අවශ්‍ය වන බැවින් අඟල් 18 ප්‍රමාණයේ පාදයෙන් ක්‍රියා කරන පොලිතින් සීලරයක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහාඅනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
රඹුක්පිටිය මහජන පුස්තකාලයේ 2022 ඔක්තෝබර් ජාතික කියවීමේ මාසය / සාහිත්‍ය මාසය වෙනුවෙන් රඹුක්පිටිය මහජන පුස්තකාලය හා ජංගම පුස්තකාල අතර පාඨක තරඟ පවත්වන ලදි. එහි ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වීම සඳහා දළ වියදම් ඇස්තමේන්තුව වන රු. 100,000.00 සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

| අනු අංකය | | ඒකක මිල | මුදල (රු) |
|---|---|---|---|
| 01 | ජයග්‍රහණය කරන ලද පාඨකයින් සඳහා ත්‍යාග ලබා දීම (චිත්‍ර, ගද්‍ය රචනා, පද්‍ය රචනා, කථික, විවාද, ජනගායනා) | 1 ස්ථාන 25 x 500 = 12,500.00<br>2 ස්ථාන 25 x 300 = 7,500.00<br>3 ස්ථාන 25 x 200 = 5,000.00 | 25,000.00 |
| 02 | හොඳම ගෘහස්ථ පුස්තකාලය තේරීමේ තරඟයේ ත්‍යාග සඳහා | | 10,000.00 |
| 03 | සහතික පත්‍ර | | 20,000.00 |
| 04 | සංග්‍රහ වියදම් | | 35,000.00 |
| 05 | ඡායාරූප හා වෙනත් | | 10,000.00 |
| | මුලු එකතුව | | 100,000.00 |

ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 –08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කඩියන්ලෙන නගරය සඳහා සතිපොලක් ඉදිකිරීම සම්බන්ධව තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති රු. 477,196.71 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කෝප්පියාවත්ත මුල්ල ජනපදයට ගමන් ගන්නා මාර්ගය පිළිසකර කර ගැනීමට තාර බැරල් 02 ක් හා කොරිමග් හෝ ABC කියුබ් 05 ක් මිල ගණන් කැඳවා ලබා දීමසුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 –10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ඉඹුල්පිටිය වසමේ සුමිතුරෝ ප්‍රජා මණ්ඩලයට ලබා දීමට අනුමත වී ඇති රු. 75,000.00 ක මුදල කාක්ක පල්ලම පාරේ වළක් සහිත කොටස සවර්ධනය කිරීම සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.
ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කඩියන්ලෙන ජනපදය, කැටඹුලා එම්. සරවනමුත්තු මයා විසින් කරන ලද ඉල්ලීමට අනුව 2020.10.14 දින බදු ගත් බහරන්ඩා සුසාන භූමියට අයත් තේ ඉඩම කප්පාදු කර ඇති බැවින් එහි අස්වැන්න නෙලා ගැනීමට මාස 6 ක පමණ කාලයක් ගතවන නිසා බදු කාලය මාස 6 ක කාලයකට දීර්ඝ කර දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මාපාකන්ද සායන මධ්‍යස්ථානයේ ජල ටැංකිය සඳහා කුළුණ ඉදිකිරීම වෙනුවෙන් වන රු. 182,102.39 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.එල්.අරුණ ශාන්ත මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදි.

05 – 13 ගරු මන්ත්‍රී ජී. කේ. ප්‍රියංගනී ෆොන්සේකා මිය
2022 සභා අරමුදල් මඟින් ලබා දෙන මන්ත්‍රී ප්‍රතිපාදන රු. 300,000.00 ක මුදල මාපාකන්ද දකුණ ජල නල මාර්ගය සවර්ධනය කර අලුත්වැඩියා කිරීම සඳහා මාපාකන්ද දකුණ ග්‍රාම සවර්ධන සමිතියට ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022.11.17 වන දින පිහිටුවන ලද අළුත්ගම ප්‍රජා මණ්ඩලය සඳහා මහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදි.

05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
බව්වාගම පිරිවෙන් විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේගේ අපවත් වීම හේතුවෙන් අදන පිරිකර පූජා කිරීම සඳහා රු. 50,000.00 ක් යෙදවීම සඳහා 2022.09.15 දින සභාවේ යෝජනා ස්ථිර වී ඇති නමුත් ගරු ආණ්ඩුකරතුමාගේ අනුමැතිය ලබා ගැනීමේදී අවශ්‍ය වන ලෙස නාවලපිටිය බව්වාගම සිරි ධම්මරතන පිරිවෙන් විහාරාධිපති පූජ්‍ය පොල්ගස්වත්තේ ජිනරතන ලොකු හාමුදුරුවන් වහන්සේගේ අපවත් වීම හේතුවෙන් ආදාහන පූජෝත්සවය වෙනුවෙන් අදන පිරිකර පූජා කිරීම සඳහා ලෙස ස්වාමීන් වහන්සේගේ නම ඇතුලත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 16 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා වන අයවැය කෙටුම්පත සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
අපේ අයවැයේදී අපේ ප්‍රදේශයට ගැලපෙන විධියට අයවැය හදලා තියනවා ගිය සැරේ වගේම. ඒ වුණාට අපේ දේශපාලන තීන්දුවක් තියනවා සභාපතිතුමා රට වැටී ඇති මේ අවස්ථාවේදී කිසිම අයවැයක් සඳහා අපේ සහයෝගය දෙන් නෑ කියලා. මම විරුද්ධ වෙනවා. විරෝධතාවය දක්වනවා දේශපාලන තීරණයක් අනුව.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
2023 වර්ෂය සඳහා ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය පස්බාගේ කෝරළේ ජනතාව වෙනුවෙන් ඉතාම හොඳ අයවැයක් ඉදිරිපත් වෙලා තියනවා. මන්ත්‍රීවරු සඳහා ඔබතුමා රු. 400,000.00 ක් පසුගිය අවුරුද්දට වැඩිය රු. 100,000.00 ක් වැඩියෙන් ප්‍රතිපාදන වෙන් කරලා තියනවා අපේ කොට්ඨාශය වෙනුවෙන් වැඩ කිරීම සඳහා. එම නිසා එම අයවැයට පක්ෂ බව මම ප්‍රකාශ කරනවා.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
ගරු ස්වාමීන් වහන්සේගෙන් අවසරයි. සභාපතිතුමනි, උප සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. අද සභාවට අයවැය කෙටුම්පත ඉදිරිපත් කරපු මොහොතේ අපිට කලින් ලැබුණා. අද රටේ තියන තත්වය හැටියට වැටිච්ච අගාධයෙන් ගොඩ ඒමට කාගෙත් සහයෝගය පාර්ලිමේන්තුව ඉල්ලුවා. සමහරෙක් නම් විවේචනය කරනවා ඇරෙන්න සහයෝගයක් දෙන් නෑ. අපිට අපේ පක්ෂ මූලස්ථානයෙන් කියලා තිබුණා විරුද්ධ වෙන්න එපා සහයෝගය දෙන්න කියලා. ඒකයි වචනයක්වත් කථා නොකළේ. අපි පක්ෂෙට ගරු කරන නිසා වැඩපිළිවෙලට විරුද්ධ උනේ නෑ. ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා මින් ඉදිරියේදී පළාත් සභා මුදල් හෝ විමධ්‍යගත මුදල් හෝ අපේ සභාවට ලැබෙනවානම් හැමදෙනාටම පොදුවේ ලැබෙන්න සලස්වනවානම් ඒකත් ඉතා වැදගත් කියලා සලකමින් මින් ඉදිරියට සවර්ධන වැඩ කොටස් කරනකොට 20 දෙනාගේම අදහස් හා යෝජනා අරගෙන මුදල් පවා වෙන් කරනකොට සමසේ බෙදා ගැනිමට ඔබතුමාගේ මූලිකත්වයෙන් වෙයි කියලා විශ්වාස කරනවා. ඉදිරි වැඩ කටයුතුවලදී කියුව ආකාරයට කරනවානම් ස්තුතිවන්ත වෙනවා.

| | | |
|---|---|---|
| පක්ෂ වූ මන්ත්‍රීවරු ගණන | - | 18 |
| විරුද්ධත්වය ප්‍රකාශ කළ මන්ත්‍රීවරු ගණන | - | 01 |
| නොපැමිණි මන්ත්‍රීවරු ගණන | - | 01 |

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව පැමිණ සිටි බහුතරයකගේ එකඟතාවය මත 2023 වර්ෂය සඳහා වන අයවැය කෙටුම්පත සභා සම්මත කිරීම සුදුසු බවට තීරණය කරන ලදි.

05 - 17 ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මහතා
අප සභාවට අයත් හයිඩ්‍රි ප්‍රජා ශාලාවේ මේ දිනවල තීන්ත ආලේප කොට අලුත්වැඩියා කටයුතු සිදු වෙමන් පවතින අතර එම ප්‍රජා ශාලාව සඳහා විදුලිය ලබා දීම සුදුසු බව මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 18 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
හයිඩ්‍රි සුසාන භූමිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරීම**

| | | | |
|---|---|---|---|
| 06 - 01 | මුදල් කාරක සභාව | - | 2022.11.15 |
| 06 - 02 | නිවාස ප්‍රජා සංවර්ධන කාරක සභාව | - | 2022.11.10 |
| 06 - 03 | කාර්මික සේවා කාරක සභාව | - | 2022.11.10 |
| 06 - 04 | පරිසර හා පොදු පහසුකම් කාරක සභාව | - | 2022.11.10 |
| 06 - 05 | ගැටුම් සමථකරණ කාරක සභාව | - | 2022.11.10 |

07. **බැංකු සැසඳුම් ප්‍රකාශය, අභ්‍යන්තර විගණන වාර්තාව, ලැබීම් සාරාංශය, ගෙවීම් සාරාංශය, ගෙවීම් වාර්තාව, පුස්තකාල ප්‍රගතිය, සංවර්ධන ප්‍රගතිය ඉදිරිපත් කිරීම**

- 2022.10.01 දින සිට 2022.10.31 දක්වා වවුචර් අංක 1165 සිට 1334 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසඳුම් ප්‍රකාශය

## බැංකු සැසඳුම් ප්‍රකාශනය - 2022 ඔක්තෝබර්

පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාව

ගිණුම්අංකය :- 053-1-001-6-4889286

මාසය :-2022 ඔක්තෝබර්

| | | | | |
|---|---|---|---|---|
| 2022.10.01 දිනට මුදල් පොතේ ශේෂය | රු. | 5,648,707.06 | | |
| එකතුකළා : ඔක්තෝබර් මස මුලුලැබීම් | රු. | 7,881,817.45 | | |
| අඩු කළා : ඔක්තෝබර් මස මුළු ගෙවීම් | රු. | 5,205,908.74 | | |
| 2022.10.31දිනට මුදල් පොතේ ශේෂය | | | රු. | 8,324,615.77 |
| එකතු කළා | | | | |
| නිකුත්කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් (උ:ලේ 01) | රු. | 654,784.23 | | 654,784.23 |
| | | | | 8,979,400.00 |
| අඩු කළා | | | | |
| අත ඉතිරි මුදල් හා චෙක්පත් (උ:ලේ 02) | රු. | 35,987.00 | | |
| බැංකුගාස්තු (උ:ලේ 03) | | 117.94 | | |
| නිෂ්කාෂන නොවූ චෙක්පත් (උ:ලේ 04) | රු. | 241,939.40 | | |
| | | | රු. | 278,044.34 |
| 2022.10.31දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | | | 8,701,355.66 |

- 2022 ඔක්තෝබර් මස ගෙවීම් සාරාංශය

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

**මාසික ඒකාබද්ධ වැයසාරාංශය - 2022 ඔක්තෝම්බර් මාසය**

| අය විෂය නාමයන් | එකතුව | මුළුඑකතුව |
|---|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,280,385.46 | |
| 02. ගමන් වියදම් | 48,172.54 | |
| 03. සැලසුම් හා උපකරණ | 913,845.40 | |
| 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 154,020.00 | |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 180,779.08 | |
| 06.පොලීගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 113,866.62 | |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 43,718.49 | |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතොෂිත | 5,238.00 | |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | | **4,740,025.59** |
| ප්‍රාග්ධනවියදම් | | |
| 09.ප්‍රාග්ධනවැය | 92,469.00 | |
| 10. ණය ආපසු ගෙවීම් | 197,676.81 | |
| **ප්‍රාග්ධන වැය එකතුව** | | 290,145.81 |
| **පුනරාවර්ථන වැය හාප්‍රාග්ධන වැය මුළු එකතුව** | | **5,030,171.40** |

| | | |
|---|---|---|
| විවිධණය හිමියන් | - | |
| කර්.ණයහිමියන් (309-3-I) | 59,720.42 | |
| කර්.ණයහිමියන් (309-3-III) | 133,181.83 | |
| කර්.ණයහිමියන් (304-5) | - | |
| 10% කර්මාන්ත තැන්පත් | 5,000.00 | |
| විවිධතැන්පත් | 122,012.19 | |
| මුද්දරතැන්පත් | - | |
| දේපලණය පොළී | 12,028.17 | |
| සේවකණය | - | |
| අත්තිකාරම් | 537,565.00 | |
| සමුච්චිතඅරමුදල | - | |
| ලිපිද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | - | |
| ජලගබඩා අත්තිකාරම් | - | |
| ස්ථාවරතැන්පත් | 100,000.00 | |
| කර්.ණයගැතියන් | | |
| **එකතුව** | | 969,507.61 |
| **2022/10/31 දක්වාමුළු ගෙවීම් වල එකතුව** | | 5,999,679.01 |

- 2022 ඔක්තෝබර් මස ලැබීම් සාරාංශය

පස්බාගේකෝරළේ ප්‍රාදේශීය සභාව

**2022 ඔක්තෝම්බර් මාසය සඳහා ඒකාබද්ධ ලැබීම් සාරාංශය**

| අය විෂයන් | මුළු එකතුව | |
|---|---|---|
| | රු.ශත | |
| 10 වරිපනම් හා බදු | **455,780.69** | |
| 20 කුලී | **111,433.80** | |
| 30 බලපත්‍ර ගාස්තු | **18,500.00** | |
| 40 සේවා සඳහා ගාස්තු | **129,193.00** | |
| 50 වරෙන්තු ගාස්තු | **1,128,170.47** | |
| 60 වෙනත් ආදායම් | **2,478,434.86** | |
| 70 වෙනත් ආධාර | **3,121,903.51** | |
| පුනරාවර්ථන ආදායම් එකතුව | | **7,443,416.33** |
| ප්‍රාග්ධන ආදායම | **-** | |
| 80 මූලධන ලැබීම් | **241,939.40** | |
| එකතුව | | 241,939.40 |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් වල මුළු එකතුව | | **7,685,355.73** |
| **වෙනත් ලැබීම්** | | |
| ජල ණයගැතියෝ | **-** | |
| ජලතැන්පත් | **1,500.00** | |
| මුද්දර | **1,525.00** | |
| විවිධතැන්පත් | **66,326.20** | |
| සේවකණය | **202,634.55** | |
| කර්මාන්තතැන්පත් | **5,972.04** | |
| දේපලණය | **12,028.17** | |
| විවිධණයගැතියෝ | **-** | |
| අත්තිකාරම්පියවීම | **521,615.00** | |
| ජල ගබඩා අත්තිකාරම් පියවීම | | |
| රු 25 මුද්දර | **1,525.00** | |
| කර්මාන්තණයගැතියෝ | **143,181.83** | |
| වෙනත්ලැබීම් | **33,924.20** | |
| වෙනත් ලැබීම් වලඑකතුව | | **990,231.99** |
| 2022/10/31 දක්වා මුළු ලැබීම් එකතුව | | **8,675,587.72** |

- 2022 ඔක්තෝබර් මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 43
02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 12
03. පොත් බැහැර දීම - 1,225
04. ව්‍යාප්ත සේවා -
05. රැස්කළ ආදායම(පුස්තකාල) - 2,930.00
(නැණසල) - 540.00

**08.<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 – 01පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | | එල්.එච්.චන්ද්‍රසේකරසහ සහෝදරයෝ, නො. 80, රජ වීදිය, මහනුවර | | | ශ්‍රීලංකා ස්ටෝර්ස්, නො. 31, කොත්මලේ පාර, නාවලපිටිය | | සුපර්කොම්ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ්, මහනුවර | |
|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | වැට්රහිත | වැට්සහිත | වර්ගය | වටිනාකම | වර්ගය | වටිනාකම |
| 1 | A4 Bundle | JK 80gsm | 1,652.18 | 1,900.00 | JK 80gsm | 1,995.00 | | 2,500.00 |
| 2 | Magazine Holder 3” | 4” Panther | 471.83 | 542.60 | | 297.50 | | 527.00 |
| 3 | Magazine Holder 6” | Panther | 574.79 | 661.00 | | 387.50 | | 634.00 |
| 4 | 9”x4” Envelope | Manila | 3.74 | 4.30 | | 4.75 | | 5.50 |
| 5 | Box File | Panther 3” Cardboard | 427.83 | 492.00 | Apex<br>Rexon | 317.50<br>597.50 | | 513.00 |
| 6 | White Board Marker Pen | Ten | 109.80 | 126.27 | Gixin | 120.00 | | 160.00 |
| 7 | CR Book 200pgs | Atlas | 347.66 | 399.80 | | 477.00 | | 590.00 |

| අනු අංකය | | නදීකාස්, නො. 33, කොත්මලේ පාර, නාවලපිටිය | | ජේපර්ලයින් ට්‍රේන්ඩින් (ප්‍රයි) ලිමිටඩ්, 14, හරස් වීදිය, මහනුවර | | |
|---|---|---|---|---|---|---|
| | | වර්ගය | වටිනාකම | වර්ගය | වැට්රහිත | වැට්සහිත |
| 1 | A4 Bundle | JK 80gsm | 2,000.00 | JK 80gsm | 1,695.00 | 1,949.25 |
| 2 | Magazine Holder 3” | | 335.00 | | 320.00 | 368.00 |
| 3 | Magazine Holder 6” | | 475.00 | | 370.00 | 425.50 |
| 4 | 9”x4” Envelope | Manila | 5.25 | | 3.70 | 4.25 |
| 5 | Box File | | 490.00 | Sevico<br>Rexon | 440.00<br>574.00 | 506.00<br>660.10 |
| 6 | White Board Marker Pen | | 115.00 | | 75.00 | 86.25 |
| 7 | CR Book 200pgs | Atlas | 398.00 | Atlas | 368.00 | 423.20 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අයිතම අංක 1සඳහා අඩුම මිල ගණන් ඉදිරිපත් කර ඇති එල්.එච්.චන්ද්‍රසේකරසහ සහෝදරයෝ, නො. 80, රජ වීදිය, මහනුවර වෙතින්ද, අයිතම අංක 2, 3 සහ 5සඳහා අඩුම මිල ගණන් ඉදිරිපත් කර ඇති ශ්‍රීලංකා ස්ටෝර්ස්, නො. 31, කොත්මලේ පාර, නාවලපිටිය වෙතින්ද, අයිතම අංක 4 හා 6 සඳහා අඩුම මිල ගණන් ඉදිරිපත් කර ඇති ජේපර්ලයින් ට්‍රේන්ඩින් (ප්‍රයි) ලිමිටඩ්, 14, හරස් වීදිය, මහනුවර වෙතින්ද අයිතම අංක 7 සඳහා අඩුම මිල ගණන් ඉදිරිපත් කර ඇති නදීකාස්, නො. 33, කොත්මලේ පාර, නාවලපිටිය වෙතින්ද අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 02 ගලබඩ ටිකට් මුද්‍රණය කර ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | Solid net | Midland printers | Rajah Press |
|---|---|---|---|---|
| | | වටිනාකම | වටිනාකම | වටිනාකම |
| 01 | ගලබඩ ටිකට් පොත් | 275.00 | 260.00 | 245.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති රාජා මුද්‍රණාලය, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 03 ගල් රෝල සඳහා බැටරි මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | විස්තරය | කොත්මලේ ටයර් හවුස් | | | M.J.R.පීරිස් සහ පුත්‍රයෝ | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | ඒකක මිළ | වගකීම් කාලය | වර්ගය | ඒකක මිළ | වගකීම් කාලය | ඒකක මිල වැට් සහිත |
| 01 | 100 AH Battery | Exide | 61,000.00 | 18 Month | Exide | 58,900.00 | 18 Month | 67,735.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති කොත්මලේ ටයර් හවුස්, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 04 ගබඩා ලැබීම් පොත් මුද්‍රණය කිරීම

| අනු අංකය | විස්තරය | Midland Printer | Rajah Press | Solid Net |
|---|---|---|---|---|
| | | ඒකක මිළ | ඒකක මිළ | ඒකක මිළ |
| 01 | GRN Books | 2,600.00 | 2,150.00 | 2,400.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති රාජා මුද්‍රණාලය, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 05 සභාව සතු ට්‍රැක්ටර් රථයට ටයර් හා ටියුබ් මිලදී ගැනීම

| අනු අංකය | **Stenor Tyre House** | | | | **M.J.R.Peiris & Sons (PVT) LTD** | | | | | **KothmaleTyre House** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ද්‍රව්‍යය | වර්ගය | ඒකක මිළ | වගකීම් කාලය | ද්‍රව්‍යය | වර්ගය | ඒකක මිළ | වැට් සහිත ඒකක මිල | වගකීම් කාලය | ද්‍රව්‍යය | වර්ගය | ඒකක මිළ | වගකීම් කාලය |
| 01 | 11 X 28 | Arpico | 106,750.00 | නිෂ්පාදන දෝෂ | 13/6-28-ටයර් | GTK - Turky 8PR | 150,955.00 | 173,598.25 | නිෂ්පාදන දෝෂ | 13.6 X28 Tyre | GRI | 142,500.00 | 1 Year |
| 02 | 11 X 28 | Ceat Super | 110,750.00 | නිෂ්පාදන දෝෂ | 13/6-28-ටයර් | GRI ශ්‍රීලංකා 12PR | 131,475.00 | 151,196.25 | නිෂ්පාදන දෝෂ | 13.6 X28 Tube | Indian | 17,300.00 | |
| 03 | 600 X 16 | Arpico | 25,975.00 | නිෂ්පාදන දෝ | 13/6-28-ටයර් | Appollo 6PR | 204,520.00 | 235,198.00 | නිෂ්පාදන දෝ | | | | |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ෂ | | | | | ෂ | | | | |
| 04 | 600 X 16 | Ceat Super | 28,900.00 | නිෂ්පාදන දෝෂ | 13/6-28-ටියුබ් | ආනයනික | 11,200.00 | 12,880.00 | නිෂ්පාදන දෝෂ | | | | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 06 වල් කපන යන්ත්‍රය සඳහා උපාංග මිලදී ගැනීම

| අනු අංකය | ද්‍රව්‍යය | ඩුබායි සෙන්ටර් | | නිව් ෆැන්සි මහල් ඉලෙක්ට්‍රොනික්ස් | | ෆැන්සි මහල් මෙගා | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම |
| 01 | GEAR Head | 01 | 3,750.00 | 01 | 3,900.00 | 01 | 3,750.00 |
| 02 | Carbacatur | 01 | 3,900.00 | 01 | 3,850.00 | 01 | 3,700.00 |
| 03 | Alan key's | 10 | 690.00 | 10 | 675.00 | 10 | 600.00 |
| 04 | S /Assy | 02 | 2,750.00 | 02 | 2,690.00 | 02 | 2,600.00 |
| 05 | Accslator | 02 | 1,200.00 | 02 | 1,150.00 | 02 | 1,000.00 |
| 06 | Ac /cable | 01 | 750.00 | 01 | 700.00 | 01 | 600.00 |
| 07 | Handle | 01 | 850.00 | 01 | 825.00 | 01 | 800.00 |
| 08 | S /plag | 02 | 1,250.00 | 02 | 1,175.00 | 02 | 1,100.00 |
| 09 | Bar | 01 | 3,600.00 | 01 | 3,450.00 | 01 | 3,250.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති ෆැන්සි මහල් මෙගා, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 07 දින පොත් මුද්‍රණය කර ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

| අනු අංකය | වර්ගය | Rajah Press | Midland Priners | Solid Net |
|---|---|---|---|---|
| | | ඒකක මිළ | ඒකක මිළ | ඒකක මිළ |
| 01 | දින පොත් | 2,100.00 | 2,300.00 | 2,250.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති රාජා මුද්‍රණාලය, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 08 4 x 3 මෙලමයින් වානේ කබඩ් එකක් මිලදී ගැනීම

| අනු අංකය | ද්‍රව්‍යය | දම්රෝ | | | සීතා හෝල්ඩින්ග්ස් ප්‍රයි ලිමිටඩ් | | | සමගි ෆර්නිචර්ස් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | ඒකක මිළ | වගකීම් කාලය | වර්ගය | ඒකක මිළ | වගකීම් කාලය | වර්ගය | ඒකක මිළ | වගකීම් කාලය |
| 01 | Medium cupboard | wo | 33,226.25 | වසර 02කි | wo | 39,990.00 | වසරකි | wo | 30,000.00 | වසරකි |
| 02 | Melamain cupboard | | | | BR 15 | 30,990.00 | වසරකි | | | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති සමඟි ෆර්නිචර්ස්, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 09 ඉගුරුඔය දුම්රිය හරස් මාර්ගයට ගේට්ටුවක් යෙදීම සඳහා මිල ගණන් කැඳවීම

| No | Description | Amila Hardware | | | Keshawa Hardware | | | Amro Agency | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Unit | QTY | Rate | Unit | QTY | Rate | Unit | QTY | Rate |
| 01 | Cement | Bag | 2.00 | 2,870.00 | Bag | 2.00 | 2,850.00 | Bag | 2.00 | 2,860.00 |
| 02 | Metal | Pan | 45.00 | 85.00 | Pan | 45.00 | 75.00 | Pan | 45.00 | 80.00 |
| 03 | Sand | Pan | 35.00 | 150.00 | Pan | 35.00 | 140.00 | Pan | 35.00 | 150.00 |
| 04 | Steel Cutting Wheel-4 ½” | Nr | 6.00 | 380.00 | Nr | 6.00 | 380.00 | Nr | 6.00 | 380.00 |
| 05 | Welding Rods | Kg | 1.50 | 950.00 | Kg | 1.50 | 900.00 | Kg | 1.50 | 950.00 |
| 06 | Grinding Wheei-4” | Nr | 1.00 | 250.00 | Nr | 1.00 | 220.00 | Nr | 1.00 | 250.00 |
| 07 | Enemal Paint-Black | Ltr | 0.50 | 2,060.00 | Ltr | 0.50 | 2,000.00 | Ltr | 0.50 | 2,050.00 |
| 08 | Enemal Paint-Yellow | Ltr | 0.50 | 2,100.00 | Ltr | 0.50 | 2,000.00 | Ltr | 0.50 | 2,050.00 |
| 09 | Thinner | Ltr | 2.00 | 1,450.00 | Ltr | 2.00 | 1,400.00 | Ltr | 2.00 | 1,450.00 |
| 10 | G.I.Pipes 1 ¼” | Nr | 2.00 | 12,500.00 | Nr | 2.00 | 12,000.00 | Nr | 2.00 | 12,250.00 |
| 11 | G.I.Pipes - 3/4” | Nr | 4.00 | 4,700.00 | Nr | 4.00 | 4,250.00 | Nr | 4.00 | 4,600.00 |
| 12 | Flat Lron -2” | Nr | 1.00 | 1,750.00 | Nr | 1.00 | 1,600.00 | Nr | 1.00 | 1,700.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අවම මිල ගණන් සපයා ඇති කේෂව හාඩ්වෙයාර්, බව්වාගම, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 10 සභාව සතු ගල් රෝල සඳහා හයිඩ්‍රොලික් මිලදී ගැනීම

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | මහේෂ් ඩිස්ට්‍රිබියුටස් | ඔටෝ ලංකා මෝටර්ස් ඇන්ඩ් ඔයිල් මාර්ට් | ගම්පොල මෝටර්ස් |
|---|---|---|---|---|---|
| | | | වටිනාකම | වටිනාකම | වටිනාකම |
| 01 | හයිඩ්‍රොලික් | 1 L | 1,950.00 | 1,600.00 | 1,800.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අවම මිල ගණන් සපයා ඇති ඔටෝ ලංකා මෝටර්ස් ඇන්ඩ් ඔයිල් මාර්ට්, ගම්පල පාර, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 11 සභාව සතු බැකෝ ලෝඩරය අලුත්වැඩියා කිරීම

| අනු අංකය | විස්තරය | සුසන්ත මෝටර්ස් | | එක්සත් මෝටර්ස් | | සම්පත් ඉලෙක්ට්‍රිකල්ස් | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම |
| 01 | ඇක්සෙල් බෙයාරින් | 02 | 49,500.00 | 02 | 54,300.00 | 02 | 49,500.00 |
| 02 | ඇක්සෙල් ඔයිල් සීල් | 02 | 13,500.00 | 02 | 14,000.00 | 02 | 14,800.00 |
| 03 | හබ් ඔරින් | 02 | 1,200.00 | 02 | 1,500.00 | 02 | 1,350.00 |
| 04 | හබ් ඔයිල් සීල් ඉනර් | 01 | 7,500.00 | 01 | 8,000.00 | 01 | 7,500.00 |
| 05 | ජැක්සිල් | 02 | 15,950.00 | 02 | 16,300.00 | 02 | 16,900.00 |
| 06 | ගියර් ඔයිල් | 02 | 5,600.00 | 02 | 5,600.00 | 02 | 5,600.00 |
| 07 | ඩීසල් කිකර් | 01 | 3,500.00 | 01 | 3,700.00 | 01 | 3,700.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 08 | හයිඩොලික් ඔයිල් | 10L | 20,000.00 | 10L | 20,000.00 | 10L | 20,000.00 |
| 09 | සයිලන්සර් රෙපයාර් | | 5,000.00 | | 5,300.00 | | 5,700.00 |
| 10 | පවර් ඉස්ටීරියන් රෙපයාර් කිට් | 01 | 9,750.00 | 01 | 10,300.00 | 01 | 10,780.00 |
| 11 | වැඩකුලිය | | 40,000.00 | | 47,000.00 | | 48,000.00 |
| | එකතුව | | 171,500.00 | | 186,000.00 | | 183,830.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අවම මිල ගණන් සපයා ඇති සුසන්ත මෝටර්ස්,නො. 53, ඉඹුල්පිටිය, නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 12 සභාව සදහා අවශ්‍ය Printer මිලදී ගැනීම සදහා මිල ගණන් කැදවීම

| | Base HP (PVT) LTD | | LH Chandrasekara & Brothers (PVT) LTD | | The office Shop (PVT) Ltd | | Paperline Trading (PVT) LTD | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **Model** | | **Model** | | **Model** | | **Model** | | | |
| | HP 315 | HP 415 | Canon G 3010 | Epson L 3210 | HP ink Tank 315 | Brother Dcp-T220 | Canon G 2010 | HP ink Tank 115 | HP ink Tank 315 | Epson L130 | HP ink Tank 415 |
| Paper Size | A4 | A4,B5, Enevelope | A4,A5, B5,Letter legal | A5 Legal | A4 | A4 | A4,A5,B5,Letter legal,Envelopes, Square, Business Card,Custom size | | | A4,A5, A6,B5,Letter legal, Envelopes, | |
| Paper Tary A4 | Input capacity 60 shets | Input capacity 60 shets | 100 Sheets | 100 Sheets | 60 Sheets | 150 Sheets | | | 60 Sheets | 50 Sheets | 60 Sheets |
| Os Support | W.10,8.1,8:1 | W.10,8 | Win 10,8.1 ,7,sp 1 | Win 10,8.1,7 | Windows 8,8.1,10*P,7 | Win 8,8.1,10,P,7 | Win 10,8.1 ,7,sp 1 | | Win 10,8.1 ,8 ,7,sp 1 | | |
| Scanner | Yes | Yes | Flatbed m/ CIS | Flat bed | Yes | Yes | Flaybed | | | | Flat bed |
| Warranty | 01Year | 01Year | 1Year Warranty or 12000 copy | 1Year Warranty or 12000 copy | 01Year | 01Year | 1Year Warranty or 15000 copy | 1Year Warranty or 15000 copy | 1Year Warranty or 15000 copy | 1Year Warranty or 15000 copy | 1Year Warranty or 15000 copy |
| Country of manufacture | China | China | China | Philipine /Malayasia | China | Philippines | | | | | |
| Price | 58,000.00 | 63,500.00 | 66,690.00 | 72,695.65 +VAT | 65,900.00 | 75,000.00 | 64,500.00 | 47,500.00 | 59,800.00 | 62,000.00 | 68,900.00 |
| Country of origin | USA | USA | USA | Japan | USA | Japan | | | China | Philippiness | China |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Printer Type | HP Thermal Inkier (Print,Copy,Scan) | HP Ink Tank Wireless(Priot, Copy<Scan,Wiirless | Ink Jet | Ink Jet | Ink Tank 3 in 1 | Ink Tank 3 in 1 | Ink Bottles | | | Ink Jet | Ink Jet |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයිම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 13 සභාව සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

| අනු අංකය | ද්‍රව්‍ය | Home Centre | | | Sarathas Stores | | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | ඒකකයක මුදල | වගකීම් කාලය | ප්‍රමාණය | ඒකකයක මුදල | වගකීම් කාලය |
| 01 | වීදුරු | 25 | 390.00 | දින 07ක් පමණි | 25 | 250.00 | |
| 02 | කොසු | 3 | 590.00 | දින 07ක් පමණි | 3 | 600.00 | |
| 03 | ඉදල් | 2 | 250.00 | දින 07ක් පමණි | 2 | 375.00 | |
| 04 | වයිපර් | 2 | 275.00 | දින 07ක් පමණි | 2 | 500.00 | |
| 05 | මොබ් | 2 | 550.00 | දින 07ක් පමණි | 2 | 725.00 | |
| 06 | ටොයිලට් බ්‍රෂ් | 2 | 275.00 | දින 07ක් පමණි | 2 | 225.00 | |
| 07 | වීදුරු තසීම් | 25 | 390.00 | දින 07ක් පමණි | 25 | | |
| 08 | කේතල් | 1 | 1,550.00 | දින 07ක් පමණි | 1 | 1,250.00 | |
| 09 | ජෝග්ගු | 2 | 425.00 | දින 07ක් පමණි | 2 | 175.00 | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයිම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 14 ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

| අනු අංකය | ද්‍රව්‍ය | Ekrain Technologies, World Trade Center, Colombo 01 | | | Global office solution, Bauddaloka Mawatha, Kurunegala | | | Green line office automation, 73, William Gopallawa Mawatha, Kandy | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | ඒකකයක මුදල | වගකීම් කාලය | වර්ගය | ඒකකයක මුදල | වගකීම් කාලය | වර්ගය | ඒකකයක මුදල | වගකීම් කාලය |
| 01 | ඇඟිලි සලකුණු යන්ත්‍රය | ZKT-Teco 628 | 69,000.00 | වසරක කාලයකි | ZKT-Teco 628 | 75,000.00 | | ZKT-Teco 628 | 78,000.00 | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති **Ekrain Technologies, World Trade Center, Colombo 01** යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 15 සභා ගොඩනැගිල්ල තීන්ත ආලේප කිරීම සඳහා මිල ගණන් කැඳවීම

| අනු අංකය | ද්‍රව්‍ය | Nawalapitiya Paint House | | Estate Suppliers Agency | | General Hardware | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම |
| 01 | Emulsion (Colours) | 4L | 7800.00 | 4L | 9950.00 | 4L | 8775.00 |
| 02 | Emulsion Weather Seal | 4L | 10250.00 | 4L | 11200.00 | 4L | 11350.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 03 | Polyurethane 9Warmish) | 1L | 1950.00 | 1L | 2500.00 | 1L | 2150.00 |
| 04 | Roll Brush | 2 | 1590.00 | 2 | 4100.00 | 2 | 1900.00 |
| 05 | Sanding Paper | NU 320 | 190.00 | NU 320 | 290.00 | NU 320 | 300.00 |
| 06 | Tinner | 1L | 1200.00 | 1L | 2400.00 | 1L | 1550.00 |
| 07 | Masking Tape | ROLL | 550.00 | ROLL | 600.00 | ROLL | 600.00 |
| 08 | Cement Sand | | | | | | |
| 09 | Lime | CU | | CU | | CU | |
| 10 | Ruff Filler | 4L | 5050.00 | 4L | 5250.00 | 4L | 5500.00 |
| 11 | Ruff Paint | 4L | 9500.00 | 4L | 10250.00 | 4L | 9750.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති Nawalapitiya Paint House, No 70/A3, Gampola Road, Nawalapiiya යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 16 වී ෂර්ට් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

| අනු අංකය | S. S. D. Lanka (PVT) LTD | | D Fashions T Shirt | |
|---|---|---|---|---|
| | වර්ගය | ඒකකයක මිල | වර්ගය | ඒකකයක මිල |
| 01 | Crocodile | 1,750.00 | Crocodile 220 GSM cotton | 1,865.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති **S. S. D. Lanka (Pvt) Ltd, Haloluwa** යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 17 පූර්ව ප්‍රසූත මාතාවන් සඳහා අත්‍යාවශ්‍ය රෝහල් උපකරණ ලබා දීම සඳහා මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම

| අංකය | විස්තරය | ඒකක ගණන | Fashion Baby, No. 76 B, Kothmale Road, Nawalapitiya | Mum & Me, 121, Ambagamuwa Road, Gampola | Kid's World, 28, Kotugodella Street, Kandy |
|---|---|---|---|---|---|
| 1 | Cheththa | 2 | 900.00 | 900.00 | 950.00 |
| 2 | Bed Jacket | 2 | 1,120.00 | 1,120.00 | 1,170.00 |
| 3 | Baby Frock | 1 | 540.00 | 540.00 | 590.00 |
| 4 | Napy Pack | 1 | 850.00 | 850.00 | 900.00 |
| 5 | Wool Kit | 1 | 730.00 | 730.00 | 780.00 |
| 6 | Baby Fanal | 1 | 730.00 | 730.00 | 780.00 |
| 7 | Baby Towel | 1 | 450.00 | 450.00 | 500.00 |
| 8 | Net | 1 | 825.00 | 825.00 | 875.00 |
| 9 | Baby Comode | 1 | 325.00 | 325.00 | 375.00 |
| 10 | Pads | 1 | 370.00 | 370.00 | 280.00 |
| 11 | Baby Basket | 1 | 1,650.00 | 1,650.00 | 1,700.00 |
| 12 | Baby Carrier | 1 | 1,450.00 | 1,450.00 | 1,850.00 |
| | Total | | 9,940.00 | | |
| | Discount | | 684.00 | | |
| | Total | | 9,256.00 | 10,480.00 | 10,750.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති Fashion Baby, No. 76 B, Kothmale Road, Nawalapitiya යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 18 රුධිර පරීක්ෂාව සඳහා කටු මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

| අනු අංකය | **The City Drugs, No. 64, Gampola road, Nawalapitiya** | | **Lanka Pharmacy, No. 83, Kothmale road, Nawalapitiya** | |
|---|---|---|---|---|
| | වර්ගය | ඒකකයක මිල | වර්ගය | ඒකකයක මිල |
| 01 | Vivachek | 109.00 | Vivachek | 107.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති **Lanka Pharmacy, No. 83, Kothmale road, Nawalapitiya** යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**09. වෙනත් කරුණු**

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී ඇස්තමේන්තුවට අනුව ආදායම් ටික ලැබෙනවානම් අපිට වැඩසටහන් ටික ක්‍රියාත්මක කරන්න පුළුවන්. 2023 වර්ෂය සඳහා ලැබෙන ආදායමට සරිලන වියදම් දරන්න පුළුවන් අයවැයක් අපි හදලා තියෙන්නේ ශුද්ධ අතිරික්තයකුත් එක්ක. මේ අයවැය සකස් කිරීමට අදහස් හා යෝජනා ලබලා දීපු ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඔබ සියළු දෙනාටම මගේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා. මේ අයවැය ලේඛනය සකස් කිරීමේදී ලේකම්තුමිය, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිතුමිය උමයංග මහත්මයා ඇතුළු අනෙකුත් සියළුම දෙනා මට ඒ නිවැරදි තොරතුරු ලබලා දුන්නා.ඒ සියළු දෙනාටම මගේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා. කොට්ඨාශයේ සියළුම රාජ්‍ය ආයතනත්අපට සහාය දුන්නා. ඒ සියළුම දෙනාටත් ස්තුතිවන්ත වෙනවා. කොට්ඨාශයේ සියළුම ස්වේච්ඡා සංවිධාන, ප්‍රජා මණ්ඩල, ග්‍රාම සංවර්ධන සමිති, සුබසාධක සමති විශාල ප්‍රමාණයක් අපිත් එක්ක එකතුවෙලා වැඩ කරනවා. ඒ සියළුදෙනාටමත් මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා.

සාකච්ඡා කිරීමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා පැමිණ සිටි පිරිසට ස්තුතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.45 ට පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

ඉහුරුඔය ගේට්ටුවේ ඉන්න එක්කෙනාට පඩි ගෙවන්න ඕනි මෙහෙන්ද ?

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

නෑ ඒක දාන්නේ බහුකාර්ය එකෙන්. ඒක අපි ප්‍රාදේශිය ලේකම්තුමත් එක්ක එකඟවෙලා කරන්නේ. 3 දෙනෙක් අනුයුක්ත කරනවා ගේට්ටු කරුවන් හැටියට. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බන්න 3 දෙනෙක් තමයි දාන්නේ. ඉහරුඔය ජනතාව එදා ඉඳලා මේ දක්වාම දැඩි විධියට ඉල්ලීම් කරා අපි කවුරු ගියත් ඒ ගොල්ලොන්ගේ පළවෙනි ඉල්ලීම තිබුනේ ඒකයි පෙන්රෝස් එකත් දාන්න ඕනි. ගරු ප්‍රවාහන ඇමතිතුමා ඇතුළු දුම්රිය සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු ඒ කණ්ඩාම ඇවිල්ලා අපි පෙන්රෝස් එකයි ඉහුරුඔය ස්ටේෂන් එකයි හයින්ෆෝඩ් දුම්රිය හරස් මාර්ගයයි ස්ථාන 3 ම අපි පෙන්නුවා. ඒ ස්ථාන 3 ටම ගේට්ටු 3 ක් ඕනි කියන එක. නමුත් මේ ගේට්ටුව එන්න එක හේතුවක් තමයි පාලම කඩාගෙන වැටීම. අනෙක් හේතුව මේ දුම්රිය හරස් මාර්ගය දාන්න පහසුවක් තියනවා. ස්ටේෂන් එකේමයි මේක තියෙන්නේ. ස්ටේෂන් එකේ සිග්නල් එක දානකොටම අරින්න වහන්න පහසුවක් මේකේ තියනවා.අනිත් තැන් 2 ටම එහෙම පහසුකම් නෑ. අලුතෙන්ම ගේට්ටු දාලා හදන්න ඕනි. දැනට එහෙම දෙයක් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් සිදු කරන් නෑ. ඒක නිසා තමයි මේ වැඩේ සිද්ධ වුනේ.මෙතන ගිහිල්ලා වාඩිවෙලා ඉඳලාම මේ වැඩේ කරගන්න අපේ හිටපු ඇමතිතුමා ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා ලොකු උත්සාහයක් දැරුවා. ඒකට අපි ස්තුතිවන්ත වෙනවා. අපේ ප්‍රාදේශීය සභාවට මෙම මුදල ගෙවන්න වෙනවා. ඇත්තටම මේ යෝජනාව කරන වෙලාවේ මේ සම්බන්ධව අපිට කිව්වෙත් නෑ. අපිට ඒ මුදල ගෙවන්න සිද්ධවෙනවා. ඒත් එක්කම අපි ABC කියුබ් 6 කුයි මැටල් කියුබ් 1 කුයි අපි ගිහින් දැම්මා පාර උස්වෙලා තියන තැන පල්ලෙහා පැත්තෙන් සකස් කර ගන්නසහ ඒ කෝච්චි පාර එතනින් ඉස්සුණාම ඒක ඇතුළට දාන්න අවශ්‍ය මැටල්වල ප්‍රමාණය. ඒක නිසා ක්ෂණිකව අපිට ඒක ගෙනිහිල්ලා දාන්න සිද්ධ උනා. ඒකටත් යම් මුදලක් අපිට ගෙවන්න වෙයි. ඒ 2 ටම ලක්ෂ 3 ½ ක් විතර මුදලක් යයි කියලා තමයි හිතන්නේ.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

අර සමනලගම සහ තවත් ගේට්ටු මුරකරුවන්ට ගෙවන්නේ පොලීසිය හරහා. මේකට එහෙම බැරිද ?

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

මන්ත්‍රීතුමා, මේක ඒකට වඩා ටිකක් උසස් මට්ටමේ ගේට්ටුවක්. මේක සිග්නල් එක දානකොට වහන්න පුළුවන්. මේකට ගේට්ටුකරුවන් පිළිබඳ ප්‍රශ්නයක් නෑ. ඒක බහුකාර්ය එකෙන් ගෙවනවානේ. රැකියා ලක්ෂේ අය ඉන්නේ. පැය 8 ඩියුටියක් යන්නේ.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
තව කල් යන්න කල් යන්න තවත් ගාන වැඩි වෙනවා. ඔකට ඉල්ලුවේ 65,000 යි. එදා 65,000 න් කරා නම් අද ප්‍රශ්නයක් වෙලා නෑ.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ඊට අමතරව ගේට්ටු කණු 2 සිටුවීම මෙහේ තියන GI පයිප්ප පාවිච්චි කරලා කරේ. ගේට්ටු 2 සකස් කරන එකත් අපි කරේ. අපේ සභාවේ සෘජු ශ්‍රමය දාලා චින්තකට කියලා තමයි අපි වැල්ඩින් කරලා ඔක්කොම කරේ. ඒකටත් අපිට වියදමක් ගිහිල්ලා තියනවා. ඒකත් අපිට ගනන් බලා ගන්න පුළුවන්.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
දැනට දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවන්න තියන මුදල ගෙවලා පස්සේ දෙපැත්තේ මාර්ගය සකස් කිරීමට යන වියදම වෙනම බලමු.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
එතනින් යනවා සිග්නල් දාන බට සෙට් එකකුයි පාර එහා මෙහා කරන කප් සෙට් එකකුයි. ඒ ටික උඩිනුත් කොන්ක්‍රීට් එක දාලා ඉවරයි දැන්. දැනට අපිට තියෙන්නේ රේල් පාරයි දාපු තැනයි අතර ගැප් එක වැඩියි. එතන පොඩ්ඩක් කොන්ක්‍රීට් ටිකක් දාන එක විතරයි. තව සතියක් විතර යනකොට ඉවර කරලා ගමන් කරන්න පුළුවන්.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
කඩියන්ලෙන ඉන්ධන පිරවුම්හලකට ඇප්ලිකේෂන් දැම්මා. පොළව යට දාන කොටසට ලොකු වියදමක් යනවා. ඒකයි පොඩ්ඩක් නැවතුනේ. එතන දිගින් අඩි 50 ක් තියනවා. පළල තමා මදි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
බෝහිල්වත්තෙන් තමා අපිට ඉඩම පවරා ගන්න ඕනි. අපි එකඟ වුනේ පල්ලෙහායින් තේ අක්කරයක් දෙනවා කියලා පන්සලට. දායක සභාවේ අය කීපදෙනෙක් තමා විරුද්ධ. දැනට RDA එකෙන් තාවකාලිකව ප්ලෑන් එකක් ඇඳලා තියනවා. පෙට්‍රල් ෂෙඩ් එකකට යන්න පුළුවන් තැනක් තමයි අපේ ප්‍රජා ශාලාවයි තට්ටු 2 ගොඩනැඟිල්ලයි කියන කොටස. Underground එකේ හාඩ්වෙයාර් වගේ දාලා එහෙම එකක් තමයි දැනට ඩිසයින් කරලා තියෙන්නේ.
මැණික්වලට රත්නපුර ළඟට ප්‍රසිද්ධ නාවලපිටිය. නීත්‍යානුකූලව මැණික් ගරන්න බලපත්‍රයක් දෙන්න ඕනි මිනිස්සුන්ට.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
මැණික් තියන ඉඩම් රක්ෂිතයට අයිතිනේ. නැතිතම් පදියම් තියනවා මාපාකන්දේ.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
නීත්‍යානුකූල කරලා මැණික් තියන ඉඩම් ලබා දෙන්න පුළුවන්නම් හොඳයි.

<u>ගරු මන්ත්‍රීඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
අපිට මැදිහත් වෙලා බලපත්‍රයක් ලබා දෙනවා වගේ දෙයක් කරන්න පුළුවන්නම් දැනට බලංතොට, වැලිගම්පල ඒ දිගටම තියනවා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ඒකට පොඩි උත්සාහයක් දරමු පර්මිට් ටිකක් ගන්න පුළුවන් විධියට.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
සභාපතිතුමා, අපි මැණික් හා ස්වර්ණාභරණ අමාත්‍යාංශයෙන් අපි ගෙන්න ගන්න ඕනි ලයිසන් එක නිකුත් කිරීමේදී අනුගමනය කරන නීති පද්ධතිය.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ඒක අපි එහෙන් පොඩ්ඩක් අහමුද සභාවේ සාකච්ඡා උනා කියලා.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
2023 වර්ෂයේ පුනරාවර්ථන ආදායම්වල වරිපනම් වැඩිවීමක් වෙලා තියනවා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
මන්ත්‍රීතුමා, 50% කින් අපි වැඩි කරමු කිව්වනේ. 2022 දෙසැම්බර් මාසේ වැඩි කරන්න කියලා තමා අපිට ආවේ. අපි ඒ සභාවේ තීරණයක් ගත්තා මේක 2023 වර්ෂයේ ඉඳලා කරමු කියලා. ඒ අනුව බච්චාගම දැනට තියන ගානෙන් 50% කුත් කඩියන්ලෙන 25% කුත් විධියට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දැනුම් දීපු විධියට වැඩි කරන්න කියලා සභා තීරණයක් තියනවා. ජල ගාස්තුත් වැඩි කරානේ. ජල ගාස්තු තියෙන්නෙත් වරිපනම් හා බදු යටතේ තමයි ඒ 2 ම තියෙන්නේ.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
ජනතාවට ඉතා අපහසු තත්වයක් ඉදිරියට උදාවෙයි. අපි කරන සේවාවෙන් හරි කමක් නෑ පහසුකම් සලසනවානම් මේ වෙලාවේ බදු වැඩි කිරීමක් ගැන එතරම් හොඳ ප්‍රතිචාරයක් නෑ. ඒ නිසා අපිට මේ ගැන මැදිහත් වීමක් වෙන්න වෙයි. ජනවාරි වෙනකොට තමයි ආර්ථික වශයෙන් දැඩි අසීරුතාවයකට මුහුණ පාන්න වෙන්නේ. විශේෂයෙන් රජයේ සේවකයන්ට තමයි මේක වැඩිපුරම බලපාලා තියෙන්නේ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ඒ අයට විතරක් නෙවෙයි හැමෝටම මේකෙන් බලපෑමක් වෙලා තියනවා.අපි ඒක අවිවාදයෙන් පිළිගන්න ඕනි. රජයේ සේවකයා විතරක් නෙවෙයි සියළු දෙනා අපහසුතාවයෙන් ඉන්නේ. සමස්ත සමාජයටම අමාරුයි. මේ විධියට රට පත් වෙන්න ප්‍රධාන මූල බීජය ගත්තොත් වැරදි දේශපාලනික තීන්දු නිසා තමයි. මේ වරිපනම් බද්ද වැඩි කරන්න මම කැමති නෑ. ඒත් අපි ඒක කරන්නම ඕනි. මේක පනත අනුව පැවරිලා තියන රාජකාරියක්. අවුරුදු 5 න් 5 ට තක්සේරු කරලා වැඩි කරන්න කියලා. නමුත් තක්සේරු දෙපාර්තමේන්තුව අපිව දැනුවත් කරලා තියනවා 50% කින් වැඩි කරන්න කියලා. මේක අපිට විතරක් නෙවෙයි ලංකාවේ සියළු පළාත් පාලන ආයතනවල අයවැය තුලදී මේක කරපු එකක්. මේක මට නොකර ඉන්න බෑ. එහෙම වුනොත් මේක අපි මන්ත්‍රීවරුන්ට අධිහාරයක් බවට පත් වෙනවා. ජල ගාස්තු ඇත්තටම 50 කින් නෙවෙයි 150 කින් වැඩි කළ යුතුයි. 150 තිබ්බ එක අපි 300 කළ යුතුයි. නමුත් අපි කළේ 200 යි. ඒ අපි කරන සේවාවට ආදායම් වියදම් හදලා බලපුවාම බට ටික මිලදී ගන්න සල්ලි නැතිවෙලා. මේ ආයතනයත් බංකොලොත් ආයතනයක් බවට පත් වෙනවා. ඒ ප්‍රමාණය අපිට වැඩි කර ගන්න බැරි උනොත්. ඒ නිසයි අපිට ඒ තත්වයට මුහුණ දෙන්න සිද්ධ උනේ. බඩු මිල අඩු උනොත් ජල ගාස්තු වැඩි කිරීමේ උවමනාවක් තිබුනේ නෑ. 10,000 ට තිබ්බ 3" බටය දැන් 35,000 යි. තුන් ගුණයකට වඩා වැඩි වෙලා. මේ ගාස්තුවම තියාගෙන අපිට මේ නඩත්තුව කරන්න බෑ. අපි අවුරුදු ගානකින් ජල ගාස්තු වැඩි කරලා නෑ.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
සභාපතිතුමා කිව්වා වගේ වැරදි දේශපාලන ක්‍රියාකාරකම් නිසා තමයි මේ අර්බුදකාරී තත්වයට මුහුණ පාන්න සිද්ධ වෙලා තියෙන්නේ. අපිට බලපාපු වසංගත තත්වයත් මේකට හේතුවක් උනා. ඒත් ඒකම විතරක් නෙවෙයි මෙච්චර උග්‍ර තත්වයකට මුහුණ පාන්න සිද්ධ උනේ. බදු 60% ක් කප්පාදු කරා. ඒක සම්පූර්ණ වැරදි දේශපාලන තීරණයක්. විදුලි බිල 2 පාරක් වැඩි උනා. ජනවාරි වෙනකොට නැවතත් වැඩි වෙනවා. ජනවාරි වෙනකොට පටන් ගන් නැතිව මාර්තු විතර වෙනකොට වැඩි කිරීමක් කරනවානම් හොඳයි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මන්ත්‍රීතුමා, පළවෙනි කාර්තුවේ මුදල් අය කරනකොට මාර්තු වෙනවා. අපි කේ පෝරම බෙදලා තොරතුරු රැස් කරගෙන පළවෙනි කාර්තුව මාර්තු අවසන් වෙනකොට ගෙවන්න පුළුවන්. අවුරුද්දටම මුලින්ම ගෙවනවානම් 10% ක වට්ටමක් හිමි වෙනවා. බව්වාගම වසමේ කීප දෙනයි ඉන්නේ. ගෙවන්න තියන ගාන පොඩියි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
වෙළඳ ව්‍යාපාරිකයන් ගෙනියපු මාෆියාවක් නිසා තමයි රටට මේ විධියට සිද්ධ වුනේ. ගම්වල සබන් නිෂ්පාදනය වැඩි වෙලා තියනවා දැන්. ප්‍රමිතිය නිසි පරිදි තියනවා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ලංකාවට වෙච්ච සිද්ධිය හොඳ ආදර්ශයක්. අපේ වගකීම ඉටු කරන් නැතුව අනිත් අයට ඇඟිල්ල දික් කරපු ජාතියක් බවට පත්වෙලා. අපි වෙනස් වෙන්න කැමති නෑ. වෙනස් විධියට හිතපු අය ලංකාව ජය අරගෙන තියනවා. හැබැයි ඒ ජය ගත් කෙනාට ලංකාවේ ජීවත් වෙන්න පසුබිමක් නෑ.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
සභාපතිතුමනි, නන්දසෝම මන්ත්‍රීතුමයි, ග්‍රාමසේවක මහත්තයයි, ආර්ථික සංවර්ධන නිලධාරිතුමියයි සම්බන්ධ කරගෙන කමිටුවක් කැඳවගත්තා නාගස්තැන්න පාර සුද්ධ කරන්න ශ්‍රමදානයක් දාගත්තා 11 වෙනිදා. JCB යන්ත්‍රය ගන්න ඕනි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
වැඩේ කරලා බිල දාන්න අපිට පුළුවන් ඒකෙදි. අත්සන් ලේඛනය ග්‍රාම සේවක මහත්තයා හරි ආර්ථික සංවර්ධන නිලධාරි හරි සංවර්ධන නිලධාරි හරි සම්බන්ධ කරගෙන දාලා දෙන්න.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
බලංතොට වැස්සත් එක්ක ආව වතුර ප්‍රශ්නයක්. ගෙවල් 2 3 ක්ම පොඩි ආරවුලකට පැටලිලා තියනවා. සභාපතිතුමා දැනුවත් කළා කිව්වා නවාස් කියලා කෙනෙක්.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අර එයාගේ මිදුල හරහා වතුර යන එක නේද ? අපි ඒ දවස්වල නම් මොකක් හරි ප්‍රතිකර්මයක් කරා. එහෙම වෙලා නැද්ද ? අපි ඒක හදලා දීලා නැද්ද ?

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
නෑ නෑ තාම හදලා දීලා නෑ.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
සභාපතිතුමා මදිහත් වෙලා ඒක බලන්න වෙයි. ඇල්ලවත්ත වතුර ප්‍රශ්නය පිල්ටර් එක පායලත් වතුර අපිරිසිදුයි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පිල්ටර් ටැංකිය හදන්නම වෙනවා.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
ඇක්වා ටැංකිය ළඟ පිල්ටර් ටැංකිය ගහලා එතනින් බෙදා හරින එක තමයි සුදුසුම ක්‍රමය. ළඟ පාත අය හරි සුද්ධ කරයි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
ඇල්ලවත්තේ ඉඳන් එක බටයක් තමා එන්නේ. මේ ටැංකියෙන් තමා ඔක්කොම යන්නේ.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
ඇස්බෝන් එකේ උඩ මුදුනට යන්නේ නෑ.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
ගලබඩ ටිකට් ප්‍රශ්නයට පරීක්ෂණයක් කරාද ?

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මන්ත්‍රීතුමිය ටිකට් එක ගෙනත් දුන් නැනේ.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
මම ගියා ගලබඩ. උදේ ඇවිත් තිබ්බ බස් එක. හවස් වෙනකල් ටිකට් කඩලා නෑ කවුරුවත්. මලගෙදරක් තිබ්බේ ගලබඩ එදා කොළඹ ඉඳන් ආව බස් එකක්.
ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
දුන් නෑ නෙවෙයි. සේවය ගලැන බලන්න ඉස්සරලා. සේවය පැහැර හැරලා රාජකාරිය පැහැර හැරලනේ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මම ඒ ගැන කථා නොකෙරුවේ මන්ත්‍රීතුමිය කිව්වනේ ටිකට් එකක් තියනවා කියලා. ලැබුණා නම් ඉස්සරහට යන්න තිබ්බා. ටිකට් එක නැතුව යන්න බෑනේ.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
රාජකාරි පැහැර හැරීම ගැන හොයන්න. ටිකට් එක ගැන පස්සේ පන්නනන්නේ. රාජකාරි පැහැර හැරීම ගැන හොයන්න.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
චෝදනාව තිබුනේ ටිකට් එක රු. 100 ට ගත්තා කියන එක ගැනනේ. ටිකට් එක තිබ්බානම් ඉදිරියට යන්න තිබ්බා.

ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා
ටිකට් එකට වැඩිය පාඩුවක් උනා ටිකට් එක ගේන්න ගිහින්.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සාක්ෂියක් පදනම් කරගෙන පරීක්ෂණයක් කරන්න ඕනි. මෛත්‍රීපාල මන්ත්‍රීතුමා ඒ වගේ අවස්ථා ආවොත් මට හරි call එකක් දෙන්න. මේ අවස්ථාවේ කියලා දැන් ඒ මිනිස්සුත් ගිහිල්ලා ඉවරයි බස් එකත් ගිහිල්ලා ඉවරයි. ඒ වෙලාවේ මට call එකක් දුන්නානම් මම ඒ වෙලාවෙම ටීම් එකක් යවනවා.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
පත්තුනුපිටියේ වැලිගොඩවත්ත කොටසට මවුන්ට්කාමල් එක පැත්තෙන් තමයි වතුර එන්නේ. ඒ කැල්ලට වතුර වතුර එන්නෙම නෑ. බට ලයින් එකක් දාලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
නඩත්තුවලින් යන්න පුළුවන් බට ප්‍රමාණයක් නම් අපි ගෙනල්ලා දාමු.

ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි

හයිබ්‍රිඩ් ඉස්කෝලේ ගුරු නිවාසේ අයින් කරනවා කියලා මන්ත්‍රීතුමා දන්නෙත් නෑ අපි දන්නෙත් නෑ. එක්කෙනෙක් ලියුමක් ඇමතිතුමාට කියලා අරන් යවලා තියනවා පළාත් අධ්‍යාපන එකට. ඒක ඇමතිතුමාගේ ලියුමකින් ගිහින් තියනවා අයින් කරන්න කියලා. පොඩි පොඩි අඩුපාඩු ටිකක් තියනවා හදාගන්න. අපි කැමතිත් නෑ කඩනවට. ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් හොයලා බලන්න.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>
මම ඒක කථා කරා. පාලුයි කියලා හදන්න දැම්මට පස්සේ ගාන වැඩියි කියලා ආවලු. ඊට පස්සේ ඇමතිතුමාට කථා කරාම එතන ළමයි අඩුයි කිව්වට පස්සේ එයාලා කියලා තියනවා. ඒ වගේ බිල්ඩින් එකක් ආය හදන එක අමාරුයි කියලා ඒක කඩන්න එපා කියලා මම කථා කරා. ඒ වුණාට සභාපතිතුමා, වහල ඔක්කොම සම්පූර්ණ කැඩිලා වැස්ස වෙලාවට වතුර ඔක්කොම ඇතුළට තමා යන්නේ. නිකන්ම කැඩිලා යයි. ඒ නිසා ඒක oction දාලා හරි කීයක් හරි ගන්න දෙයක් හරි නැත්තම් නිකන් කැඩිලා යනවා. ඒක නිසා සල්ලි කීයක් හරි දාලා හදන්න පුළුවන්නම් හොඳයි. ඒකට ඉස්සරලා හයිබ්‍රිඩ් ඉස්කෝලේ ඉඩම මනින්න ඕනි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
අධ්‍යාපනය අය නේද මනින්න ඕනි ? අපි ඒක දැනුවත් කරමු.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
ගරු සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීවරුනි අද දින පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ අයවැය කෙටුම්පත ඉදිරිපත් කරපු අවස්ථාව ඒවගේම ගරු සභාපතිතුමා විසින් දුම්වැටි නිවාරණ වැඩසටහනක් පිළිබඳ දැනුවත් කිරීමක් කරන්නට වෙළඳසැල්වලට ඒ අදහස ඉදිරිපත් කරා. පස්බාගේ කෝරළේ බලංතොට ප්‍රදේශයේ නම් සිරිසේන මන්ත්‍රීතුමත් දන්නවා වෙළඳසැල්වල නම් ගැටළුවක් නෑ. ඒවගේ නම් මත්ද්‍රව්‍ය විකුණන්නේ නෑ. නමුත් අපට ප්‍රධාන ප්‍රශ්නයක් තියෙන්නේ ඒ පැත්තේ අනෙක් මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නය තමයි තියෙන්නේඒ පිළිබඳවත් මොනවාහරි නිවාරණ වැඩසටහනක් කරමුයි කියලා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. දුම්වැටි විකුණන්නේ නැති වෙළඳසැල් තියනවා කාලයක් ඉඳලම. මම ඊයෙත් මයුරා ට්‍රේඩර්ස් කථා කරා. මට එතුමා සහතිකයක් පෙන්නුවා මම උදාහරණයක් විදියට ඔබතුමාට මතක් කරන්නේ. එතුමා මීට වසර 10 කට පමණ පෙර මැදිරිගිරිය ප්‍රදේශයේ තමයි එතුමාගේ වෙළඳසැල තිබිලා තියෙන්නේ. ඒ කාලේ ලක්ෂ 2 කට වැඩිය දිනකට සිගරට් විකිණිලා තියනවා ඒ වෙළඳ සැලේ. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙළඳසැලට ගිහිල්ලා කිව්වලු මම මෙහෙම වැඩසටහනක් ක්‍රියාත්මක කරලා තියනවා ඔබතුමා මේකට සහයෝගය දෙන්න ඕනි කියලා පෞද්ගලිකව වෙළඳසැලට ගිහින් කිව්වට පස්සේ මොකක්ද වෙන්න ඕනි ඇහුවට පස්සේ කිව්වලු මේ දුම්වැටි විකුණන එක නවත්වන්න කියලා වෙන ඕනි සහයෝගයක් දෙන්නම්. ඊට පස්සේ එතුමා ඒ වෙළඳසැලට අරන් ගිය සිගරට් තොගය අලෙවි කලාට පස්සේ එදායින් පස්සේ සිගරට් විකිණීම නතර කරලා. එතුමට එතුමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහතිකයක් නිකුත් කරලා තියනවා එවකට අමාත්‍යවරයා විදියට ජනාධිපතිතුමා සහතිකයක් නිකුත් කරලා තියනවා දුම්වැටි අලෙවිය නතර කරපු එකට. ඒ වගේම මේ ප්‍රදේශයෙත් එහෙම දුම්වැටි අලෙවිය නවත්තන අයට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට ඒ අයට සහතිකයක් නිකුත් කරොත් එහෙම ඒ අයට පොඩි වටිනාකමක් තියනවා. නිකන්ම නැවැත්තුවා හා සමාන නොවන විදියට.
ගලබඩ ටිකට් ප්‍රශ්නය මන්ත්‍රීතුමන්ලා දෙපලක්ම අදහස් ඉදිරිපත් කරා. පසුගිය සභා වාරයේදී ගරු චන්ද්‍රිකා මන්ත්‍රීතුමිය ටිකට් එක සභාවට එවන්නම් කියලා ඒක එව්වේ නෑ. කෙසේ වෙතත් ඒ චෝදනාව අපි බැහැර නොකළ යුතුයි. ඒක නිසා අපි මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න වෙනවා සභාපතිතුමනි. මොකද සභාවේ කම්කරු මහත්මයෙක්නේ යන්නේ එතනට. එතුමා රාජකාරිය පැහැර හරින එක ටිකට් අලෙවි නොකරන එක ගැන අවධානය යොමු කළ යුතු වෙනවා. මොකද එතුමා දුම්රියෙන් යනවා ඇත්තේ 10.30 11.00 වෙනවා ඇති. ඒ වෙද්දි ගිහින් ඉන්න සංචාරකයෝ නොමිලේ නරඹන්න ඇතුල් වෙලා ඉන්න පුළුවන්. ඒත් එක්කම කලින් එනවා ඇති එතුමට දුම්රිය මඟ ඇරෙන නිසා. ඒ වගේ මොනවාහරි අවධානයක් යොමු කරලා නිසියාකාරව ඒ ප්‍රවේශපත් ලබා දෙන්න යම්කිසි වැඩපිළිවෙලක් කරොත් හොඳයි කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න කැමතියි. අපි ක්‍රමානුකූල වැඩපිළිවෙලකට යනකල් ඒ චෝදනා 2 ම පිළිබඳ අවධානය යොමු කළ යුතු වෙනවා. මොකද සභාවට ලැබෙන ආදායම කොටසක් හරි නොලැබෙන එක පාඩුවක්. ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේ ඔබතුමාට මතක් කරනවා. ඒවගේම අපි සාකච්ඡා කරා කමිටුවේදි ගරු සිරිසේන මන්ත්‍රීතුමාත් මමත් නාගස්තැන්න පාර ශ්‍රමදානයක් යොදා ගන්න ලබන 11 වෙනිදා. ඒ සඳහා ඔබතුමා සභාවේ සහයෝගය ලබා දෙනවා කියලා අපට ප්‍රකාශ කළා. එදිනට සභාවේ JCB යන්ත්‍රයත් එදිනට නාගස්තැන්නවත්ත, හැරන්ඩල්වත්ත, සමගිවත්ත, කන්ඩල්ඔයවත්ත ඒ වතු අධිකාරිවරුන්ට හා ඒ ප්‍රදේශයේ තියන ස්වේච්ඡා සංවිධානවලට ඔබතුමා දැනුම්දීමක් කරනවා නම් හොඳයි කියලා. එතකොට ඒ අයත් දැනුවත් වීමත් වෙනවා උනන්දු වෙනවා. ඒ නිසා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා මේ අවස්ථාවේ විශේෂ ඉල්ලීමක් කරනවා.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
සභාපතිතුමා දෙසැම්බර් 01 වෙනිදා ඒඩ්ස් නිවාරණ දිනයට සමගාමීව වැඩසටහනක් පැවැත්වෙනවා හොස්පිට්ල් එකේ. ඒක ඇත්තටම මත්ද්‍රව්‍ය මූලික කරගෙන තමයි කරන්න සූදානම් කරලා තියෙන්නේ. පළවෙනි එක පොලිසියට තියෙන්නේ. ගම්මට්ටමින් තරුණයෝ මේකට ඇබ්බැහි වෙලා ඉන්න ගෙනල්ලා දේශනය පවත්වන්න සූදානම් කරලා දෙන්න කියලා තමයි කිව්වේ. ඒක වෙන් නෑ. මේකට මම හිතන්නේ ගැණු ළමයි වයස් සීමාවක් දක්වලා ඒ අයත් එක්ක සම්බන්ධකම් පවත්වන ගැනු ළමයි ටිකක් ඉන්නවා අපිට දැනුවත් කරනවානම් දැනුවත් කරන්න වෙන්නේ ඒ හරහා. ගෙවිලවල ඉන්න කාන්තා පාර්ශවය ගෙන්නලා මේවගේ ආදීනව කියලා දෙන්න පුළුවන්නම් එයාලා අවධානෙන් ඉන්නවානේ. අපිට පුළුවන්ද ඒ වගේ දැනුවත් කිරීමේ වැඩසටහනක් කරන්න ?

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
අපිට පුළුවන් කරන්න. ඉලක්කගත කණ්ඩායමක් තෝරාගෙන කරන්න පුළුවන්.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
ගරු සභාපතිතුමනි, ගලබඩ දියඇල්ල ගැන කථා කරපු නිසා ඒ ගැන පොඩ්ඩක් කථා කරන්න ඕනි. බොරුවක් වංචාවක් කරා නෙවෙයි අපි ගිහිල්ලා ගත්ත දෙයක්.ශිරෝමි මන්ත්‍රීතුමිය අද හිටියනම් හරි. මොකද ශිරෝමි මන්ත්‍රීතුමිය තමයි කොමසාරිස්තුමාට පවා කථා කරලා ඒ ගැන දැනුම් දුන්නේ. පහර ගහනවා නෙවෙයි. ඊට පස්සේ කොහොමහරි අපේ ලේකම්තුමිය මුණ ගැහිලත් කථා කරලා තියනවා. මට ටිකට්වල ප්‍රශ්නේ උනේ මම ටිකට් ටික ගෙදර තියනවා කියලා තමයි මම ගියේ. ඒත් මම මගේ වැඩ දාලා ගියේ යං කියනකොට වංචාවක් නොකරපු නිසා. නමුත් මම කොළඹ ගියපු වෙලාවක එහේ දාලා ඇවිත් පුතාලගේ ගෙදර ඒක තමා මට වෙච්ච අකරතැබ්බය.ඒකට මට ඔයගොල්ලන්ට කියන්න දෙයක් නැති නිසා හිටියේ. ෆෝන් එකේ 100% ක් මම වැඩ කරන්න දන්නේ නැහැ. මට ඒ වීඩියෝ ටික ගන්න ආපහු ලබා ගන්නනම් මට පුතා ළඟට යන්න ඕනි ඒ ටික කරගන්න. ඒ ලබා ගත්තහම වීඩියෝ එකේ තියන එක හරි දාලා පෙන්නන්නම් සභාවේදි. බොරුවක් කියලා මට එහෙම කරන්න අවශ්‍යතාවයක් නැහැ. අපි එතෙන්දි විශේෂයෙන් බැලුවේ සභාවට එන ආදායම නැති එක එහෙම ගානක් ගන්නවානම්. ඊට පස්සේ සභාපතිතුමාට මතක ඇති රු. 50.00 ගානේ හැඳුවම කොච්චර පාඩුවක්ද ඒක කියලා. දැන් අද මෛත්‍රීපාල මන්ත්‍රීතුමාගෙනුත් දැන ගන්න ලැබුණා මලගෙදරක ආපු කට්ටියක් ගියා ටිකට් කඩන කවුරුත් හිටියේ නෑ කියලා. මං කණගාටුවෙනවා ගරු උපසභාපතිතුමා පිළිබඳව රාජකාරි කරන කෙනා දුම්රියෙන් යනවද කියන එක. අපි දන්න තරමින් යන්නේ බයික් එකේ. බයික් එකේ ගිහිල්ලා බයික් එකේ එන්නේ. ගිය සභා වාරයේදි කිව්වා අතිකාල දීමනා දීලා කරන්නේ පෙට්‍රල් වියදම හරි කවර් කරගන්න එහෙම දෙයක් කියලා. ඉතින් මේ පරස්පර ඒවා එනකොට අපිට හරි කණගාටුවක් හිතෙනවා අපි එකම දේ ගැන කථා කරේ. අපිට අවශ්‍යතාවයතියෙන්නේ සභාවේ ආදායම ලබා ගන්න එක. එතන ප්‍රධාන දේ රාජකාරිය පැහැර හැරීම. එයා රාජකාරියේ හිටියා නම් මේ කිසිම ගැටළුවක් මතු වෙන්නේ නෑ.එයා රාජකාරියේ නොහිටපු නිසයි ඒ සේරම ගැටළු මතු උනේ. නමුත් ඔබතුමන්ලා ඒ ඔක්කොම පැත්තක තියලා මේ ටිකට් එක තමයි සාක්ෂිය කියනවා. ඊට වඩා එතන හිටපු අය සහ නොගිය එක ගැන ලේකම්තුමියත් දන්නවා එදා රාජකාරියට කවුරුත් එතන හිටියේ නෑ කියලා. එතුමිය දැනුම් දීලා කමයි කට්ටිය ගියේ. ඒක සාක්ෂියක් නෙවෙයිද ටිකට් එක පමණද සාක්ෂිය කියන එක. මම ශිරෝමි මන්ත්‍රීතුමිය එක්ක කථා කරලා වීඩියෝ ඇති අපිත් එක්ක ගිය අය ළඟ. මට ඒ ටික ගන්න බැරි උනා. මම උත්සාහ කරනවා මොන විධියකින් හරි වීඩියෝ එකක් අරගෙන ඔබතුමන්ලාට ඉදිරිපත් කරන්න. ඒ නිසා පොඩි කණගාටුවක් තියනවා චෝදනාවක් කිරීම ගැන. චෝදනාවක් කරන්න එපා මොකද අපි එතනට ගිහින් ඒ වෙච්ච දේත් එක්ක තමයි හැමදේම කිව්වේ. ගෙදර ඉඳලා කාගෙවත් කීමකට කියපු කරපු දෙයක් නෙවෙයි.ඒක තමයි ගැටළුව.
අනිත් එක කෙටුම්පත ගැන ම කථා කරන්න කැමති නැහැ. මොකද ගොඩක් අසරණ වෙලා ඉන්න වෙලාවක්. කෙටුම්පතේ දේවල් ගැන කියන්න ඒවා කරන්න බැහැ. මෛත්‍රීපාල මන්ත්‍රීතුමා කිව්වා වගේ ඉහළින් ආපු නියෝගය සහ ඒ අනුව අපිට කටයුතු කරන්න සිද්ධ වෙලා තියන නිසා තමයි ඒ නිහඬතාවය ප්‍රකාශ කරේ. ඒ ටික තමයි මට කියන්න තියෙන්නේ බෙහොම ස්තුතියි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
ගරු මන්ත්‍රීතුමිය මම ප්‍රකාශ කරේ සමහර වෙලාවට දුම්රියෙන් යනවා. බයික් එකෙන් යනවාද කියලා මම දන්නෙත් නෑ. එතුමා ඒ සේවා ස්ථානයට යන ආකාරය තමයි මම සැකෙවින් අදහසක් විධියට පකාශ කරේ. ඒක එච්චර වරදක් දකින්න දෙයක් නෙවෙයි. එතුමා ඒ සේවා ස්ථානයට ගිහිල්ලා රාජකාරිය පැහැර හරිනවානම් ඒක තමා මම කරුණු ඉදිරිපත් කරේ. නමුත් ඔබතුමිය හරිනම් එතන පරීක්ෂණයක් කරා නම් රු.100 ට ටිකට් පත් විකුණුවා කියලා සභාවේ කීප වතාවක්ම කිව්වා. නමුත් ඔබතුමියට ඒක ඔප්පු කරගන්න බැරි උනා. හරිනම් මොකද වෙන්නේ ? අපි සභාව තීරණයක් ගත්තා නම් එහෙම ඒ සේවකයාගේ සේවය අත්හිටුවන්න තරම් වැරැද්දක් වෙනවා ඒක. මේ සභාවේ වැඩ කරන සේවකයෙක් ඒ වගේ වැඩි මුදලකට ටිකට් පතක් මුද්‍රණය කරලා විකුණයි කියලා අපි විශ්වාස කරන් නෑ. සභාවෙන් දෙන ටිකට් පොත්වලින් තමයි නිකුත් කරන්නේ. රු. 100 ට ටිකට් නිකුත් කරා කියලනේ ඔබතුමිය කිව්වේ. මේ වාර්තාවෙත් පැහැදිලිව තියනවා. නමුත් මේ වාර්තාව කොමසාරිස්තුමාටත් යනවා එතුමත් බලනවා. ඊට පස්සේ සභාව ගැනයි සභාවේ වැඩ කරන සේවකයෝ ගැනයි අපැහැදිලි චිත්‍රයක් මවා ගන්නවා. ඒ නිසා අපි යම් කිසි දෙයක් සභාවේ කියනවානම් ඒක ඔප්පු කරන්න පුළුවන් දෙයක් කියන්න නැත්නම් නොකියා ඉන්න. සභාව කියන්නේ ගරු සභාවක්. ඔබතුමිය චෝදනා කරන්නේ සභාවේ සේවක මහත්තයෙක්ට. ඔබතුමිය එදා කිව්වා දැන්වීම් පුවරුවේ දාලා තියනවා කියලා ගාන රු.100 යි කියලා. ලේකම්තුමිය දැනුම් දීලා එවෙලේම එතන ෆොටෝ එකක් ගෙන්න ගත්තා. ඒකේ එහෙම නෑ. අපි එතනට විනෝදයට ගියාට එතන සේවය කරන සේවකයා ගැන ප්‍රශ්න කරන්න අපිට අයිතියක් නෑ මන්ත්‍රීවරු විධියට. ඒකත් අපි තේරුම් ගන්න ඕනි. කාර්ය මණ්ඩලයේ කිසිම නිලධාරියෙක්ගෙන් ප්‍රශ්න කරන්න අපිට කිසිම අයිතියක් නෑ. ඒකත් අපි තේරුම් ගන්න ඕනි. ඔබතුමිය එදා කිව්වා ටිකට් පත ගෙදර තියනවා කියලා. එදා සභාපතිතුමා වාහනයක් දීලා ඔබතුමිය යැව්වා ටිකට් එක එවන්න කියලා. ඔබතුමිය දැන් කියනවා තියෙන්නේ කොළඹ කියලා. පැහැදිලිව ඔප්පු කරන්න බැරි දෙයක් අපි මේ සභාවේ කියන්න හොඳ නෑ. එතන පරීක්ෂණයක් කරා නම් ඒ සේවකයට තමයි වැරැද්ද එන්නේ. එතුමා සභාපතිතුමාට පැමිණිල්ලක් කරලා මට චෝදනාවක් කරලා තියනවා කියලා එතුමට පුළුවන් පියවරක් ගන්න.

ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා
ඒ ගේන ටිකට් එක මේ සභාවේ සියළු මන්ත්‍රීවරු පිළිගන්නවා එදා ගෙනාවානම්. ටිකට් එකක් ඕනි විධියට හදන්න පුළුවන්. එදා දවසේ ටිකට් එක ගෙනාවානම් අපිට තිබුණා පරීක්ෂණයක් කරන්න. හෙට ගේන ටිකට් එක අපිට පිළිගන්න බැහැ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අයවැය කෙටුම්පත සභාවට ඉදිරිපත් කරනු ලැබුවා. අද දවසේ අපේ අයවැය කෙටුම්පත සම්මත කරගන්න ලැබුණා ඔබතුමන්ලාගේ සහයෝගයත් එක්ක. පසුගිය අයවැයෙන් වෙන් කරපු සල්ලි හැමෝටම දුන්නා. හැම මන්ත්‍රීවරයෙකුටම එක හා සමානව සැලකුවා. චන්ද්‍රිකා මන්ත්‍රීතුමිය කිව්වා ශිරෝමි මන්ත්‍රීතුමිය කොමසාරිස්තුමාට කථා කරා කියලා. කොමසාරිස්තුමාට

නැතුව මට කථා කරලා තිබ්බානම් මේ ප්‍රශ්නය මේ වෙද්දි විසඳිලා. පනත අනුව සභාවේ බලතල තියෙන්නේ සභාපතිවරයා ඇතුළු සභාවට. කොමසාරිස්තුමා ලියුමක් එවලා තියනවා මෙහෙම දෙයක් වෙලා තියනවා ඒ ගැන බලන්න කියලා. ඒ වෙලාවේ මට කියලා තිබ්බානම් ක්ෂණිකව ක්‍රියාත්මක වෙලා බලනවා. එමෙ කරානම් ඔබතුමියගේ චෝදනාවත් සමහරවිට ඔප්පු කරගන්න තිබ්බා. ගලබඩ ගැන කියනවානම් මෙකේ ආදායම සත 5 ක්වත් අපිට ආවේ නෑ. වත්තෙන් ටිකට් එකක් කඩන්න පටන් ගත්තේ. මම ගිහින් ටිකට් පොතුයි, ඒ මනුස්සයත් අල්ලන් මෙහෙට ගෙනාවේ. ඒ අවස්ථාවේ ගත්ත උත්සාහය නිසා තමයි මෙහෙම හරි කීයක් හරි සභාවට එන්නේ. ගලබඩ දිය ඇල්ල සම්බන්ධව විධිමත් වැඩපිළිවෙලක් ඉදිරියට කරගෙන යනවා.